SPMC

# ඇබෑර්තු

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

## සෞඛ්‍ය අමාත්‍යාංශය

පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත්, කාර්යශූර, ස්වයංගාමක, වෘත්තීය උන්නතිගාමී කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ හැකි අයවළුන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමග අත්වැල් බැඳ ගැනීම අපි අපේක්ෂා කරමු.

**සෑම අයදුම්කරුවකුම ;**

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය

ii. තනතුරෙහි රාජකාරී මැනවින් ඉටුකරලීමටත්, දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමටත්, කායිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයකින් හෙබි අයකු විය යුතුය.

## 01. කළමනාකරු - නිෂ්පාදන

**(MM 1-1 - 11 වන ශ්‍රේණිය)**

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්**

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ස්වභාවික විද්‍යා, ඖෂධවේදය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පළමු උපාධිය

හෝ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් ලබාගත් වෙනත් සමාන ප්‍රථම උපාධියක්

සහ

(ආ) පරිගණක සාක්ෂරතාව

සහ

(ඇ) ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ අවම වශයෙන් වසර 05 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**සුදුසුකම් : (අභ්‍යන්තර අයදුම්කරුවන්) (පහත 1 හෝ 2)**

01. බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය ඉහත සුදුසුකම් ලබා තිබීම

02. තනතුරට අදාළ විෂය පරාසය තුළ කනිෂ්ඨ කළමනාකරු (JM 1-1) ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

- **වැටුප් පරිමාණය :**

  MM 1-1-2016 - රු. 53,175/- - 10 x 1,375/- - 15 x 1,910/- - 95,575/-

  ඉහත වැටුප් වලට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

- **වයස :**

  අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

- **බඳවා ගැනීමේ ක්‍රමය :**

  ලිඛිත තරගකාරී විභාගයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්.

## 02. ඖෂධ නිමා කිරීමේ සහායක (PL-2 III වන ශ්‍රේණිය)

**සුදුසුකම් : බාරහිර අයදුම්කරුවන් (පහත 1, 2 හෝ 3)**

01. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්ෂණ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 2 ට (NVQ 2) නොඅඩු ඖෂධ ඇසුරුමට අදාළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

02. සිංහල / දෙමළ, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂයයන්ට සම්මාන සාමාර්ථ 4 ක් සමග අ.පො.ස. (සා/පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත්වීම.

සහ

ඖෂධ ඇසිරීම පිළිබඳ එක් වසරක පළපුරුද්ද.

03. **අභ්‍යාස ලාභීන් බඳවාගැනීම**

සිංහල / දෙමළ, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂයයන්ට සම්මාන සාමාර්ථ 4 ක් සමග අ.පො.ස. (සා/පෙ) විභාගය විෂයයන් හයකින් (06) සමත්වීම

සහ

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අභ්‍යාස ලාභී ඖෂධ නිමා කිරීමේ සහායකයකු ලෙස වසර එකක පුහුණුව සම්පූර්ණ කර ඖෂධ නිමා කිරීමේ සහායකයකු වශයෙන් ස්ථිර සේවයට ඇතුළු වීම.

**සුදුසුකම් : අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

01. බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය ඉහත සුදුසුකම් ලබා තිබීම

02. වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කළ, ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 2 ට නොඅඩු නිපුණතා සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක ක්‍රියාකාරී පළපුරුද්ද සම්පූර්ණ කළ නුපුහුණු මට්ටමේ සේවකයින්.

- **වයස :**

  අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

- **වැටුප් පරිමාණය :**

  PL-2-2016 - රු. 25,750/- - 10x270-10x300-10x330-12x350 - 38,950/-

- **බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකිනි.

**ආන්තික ප්‍රතිලාභ :**

- පැමිණීමේ හා කාර්ය සාධන දිරි දීමනා
- භාවිතයට නොගත් වාර්ෂික හා අසනීප නිවාඩු සඳහා මුදල් ගෙවීම
- වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සහ වෛද්‍ය වියදම් සඳහා වැයවූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම
- සේ.අ. අරමුදල සඳහා සංස්ථාව වැටුපෙන් 15% කින් දායක වන අතර, සේවක 10% කින් දායක විය යුතුය (EPF)
- සංස්ථාව වැටුපෙන් 3% කින් සේ.භා. අරමුදලට දායක වනු ඇත (ETF)
- 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට හා MSD චක්‍රලේඛයට අනුකූලව පාරිතෝෂිකය ගෙවනු ඇත
- අනෙකුත් අමතර ප්‍රතිලාභ

**පොදු උපදෙස් :**

- නියමිත ආකෘති පත්‍ර මගින් පිළියෙළ කළ අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනකුගේ නම්, ලිපින හා ඇමතුම් අංක සමග ඉදිරිපත් කළ යුතුය. සියලුම අධ්‍යාපන සහතික වල සහතික කළ පිටපත් අයදුම්පත සමග එවිය යුතුය. අයදුම්පත රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වෙබ් අඩවිය https://www.spmc.gov.lk වෙතින් බාගත කර ගත හැකිය.
- රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් තෝරාගනු ලැබුවහොත්, තනතුර භාර ගැනීමට මුදා හැරිය හැකි බවට සහතික කරන අංශ ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත්, බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කොට මෙම දැන්වීමේ දිනයේ සිට දින 10 ක් ඇතුළත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.
- ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**සභාපති,**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,**
**නො. 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,**
**කඳවල වත්ත, රත්මලාන.**